## පස

පි.එච්. අගය 6-6.5 ක් පමණ වන, හොඳින් ජලය බැස යන පසක් අනෝද වගාවට යෝග්‍ය වේ. නමුත් අහිතකර පාංශු තත්වයන් දරාගත හැකි වැලි අනෝද ශාකය පාංශු පී.එච්. අගය 5.0-8.0 දක්වා වූ පරාසයක පවා හොඳින් වැඩේ.

## ප්‍රචාරණය

අනෝද ප්‍රචාරණය සඳහා බීජ හා බද්ධ පැල යොද ගනී. කටු අනෝද සහ සීනි අනෝද බීජ මගින් ප්‍රචාරණය කල හැකි නමුත් චෙරිමෝයා හා වැලි අනෝද වල බීජ පැළ වල ලක්ෂණ මව් ශාකයේ ලක්ෂණ වලට වඩා වෙනස් විය හැකි නිසා ප්‍රචාරණයට බීජ පැළ යොද ගැනීම සුදුසු නැත. අනෝද විශේෂය අනුව බීජ ප්‍රරෝහනයට දින 20-50 පමණ ගතවන අතර, සාමාන්‍යයෙන් 85-95% පමණ ප්‍රරෝහන ප්‍රතිශතයක් ලබාගත හැකිය. ක්ෂේත්‍රයේදී බීජ වල ජීව්‍යතාවය අඩුවන බැවින් බීජ ඵල වලින් ඉවත්කල වහාම ප්‍රරෝහනයට භාවිතා කිරීම වඩා සුදුසු වේ. බීජාවරණය සීරීම සහ ජලයේ පෙඟවීම මගින් ප්‍රරෝහණය ඉක්මන් වේ.

අනෝද බීජ මාස 1 1/2 - 2 ක් පමණ කාලයක් අඩු උෂ්ණත්වයක් යටතේ ගබඩාකර තබාගත හැකිය. සියළුම අනෝද වර්ග කුකද්කද බද්ධ ක්‍රමය මගින් බද්ධ කිරීම මගින් සාර්ථකව ප්‍රචාරණය කල හැකිය. මෙහිදී තෝරාගත් සුදුසු මව් ශාකයකින් ලබාගත් අනුජ, එම අනෝද විශේෂයන්ම ග්‍රාහක ශාකයකටම බද්ධ කිරීම සුදුසුය.

## පැළ සිටුවීම

හොඳින් හිරුඑළිය ලැබෙන හොඳින් ජලවහනය සිදුවන බිමක් වගාවට තෝරා ගතයුතුය.

පැළ සිටුවීම සඳහා පරතරය

කටු අනෝද - මීටර් 4x4

සීනි අනෝද - මීටර් 4x4

චෙරිමෝයා - මීටර් 4x4

දිග, පළල, උස සෙන්ටි මීටර් 60x60x60 වනසේ වලවල් සකසා ගෙන වැලි: මතුපිට පස්: ගොම 1:1:1: වනසේ වලවල් වන සේ සකසාගත් මාධ්‍යයෙන් පුරවා සතියකට පමණ පසු තෝරාගත් නිරෝගී පැළ සිටුවිය යුතුය.

## නඩත්තුව

ක්ෂේත්‍රයට අවශ්‍යවිට ජලය සැපයීමෙන්, පසට වැඩිපුර දිරාපත් කාබනික ද්‍රව්‍ය යෙදීමෙන්, පැළ සිටුවීමේදී හා සිටුවා සෑම වසරකට වරක් රසායනික පොහොර මිශ්‍රනයක් භාවිතයෙන්, නිරන්තරයෙන් ක්ෂේත්‍රය පිරිසිදුව තබා ගැනිම මගින් අහිතකර වල්, කෘමින් හා රෝගකාරක ඇතිවීම පාලනය කර සාර්ථක නිරෝගී වගාවක් පවත්වා ගත හැකිය. සුළං බාධක යොද වගාව සුළඟින් ආරක්‍ෂා කිරිමද වැදගත්ය.

## කප්පාදුව

ශාකයේ අනවශ්‍ය දිරාපත්, රෝගී අතුරිකිලි කප්පාදුකර නිසි සැලකිල්ලක් පවත්වාගෙන යාම නිරෝගී ගුණාත්මක වගාවකට අත්‍යාවශ්‍ය වේ.

## මල් පරාගනය

ක්ෂේත්‍රයේ සිටුවා වසර 3 හෝ ඊට පසු අනෝද මල් හටගැනීම ඇරඹේ. අනෝද මල් පරාගනය සිදුවනුයේ කෘමීන් හෝ සුළඟ මගිනි. ඵලවල හැඩය විශාලත්වය සහ අස්වැන්න පරාගනය මත රඳ පවතී. අනෝද මල් පිපෙන කාලයේදී අධික වර්ෂාව සහ තද සුළඟ පැවතිම අස්වැන්න අඩුවීමට හේතුවේ. පරාගනයට උපකාරීවන කෘමි ගහනයක් පවත්වා ගැනීම හා කෘතිම පරාගනය මගින් අස්වනුවල ප්‍රමාණය හා ගුණාත්මය ඉහළ නැංවිය හැකිය.

## අස්වැන්න

නිවැරදි පරිනත අවධියේදී එනම් ඵලාවරනය නෙරීම් ස්වභාවය අඩුවී තරමක සුමුදු තත්වයකට පත්වූ, කොළ පැහැයේ සිට ලා කහ කොළ පැහැයට වෙනස්වූ පිරුණු ඵල නෙලාගැනීම සඳහා සුදුසුය. සාමාන්‍ය තත්ව යටතේ ඉදුණු අනෝද ගබඩා කිරීම අපහසුය.

## පසු අස්වනු හානි අවමකර ගැනීම

පසු අස්වනු හානි ඇති කරන ඇන්ත්‍රැක්නෝස් රෝගය ඇතිවීමට ක්ෂේත්‍රයේදී ගස් නිසි ලෙස නඩත්තු නොකිරීම හේතුවේ. ගසට මනාව හිරු එළිය ලැබෙන සේ අතු කප්පාදු කිරීමෙන් නිසි පරිදි ජලය හා පොහොර සැපයීමෙන් රෝගය පාලනය කළ හැකිය. අනෝද වල පසු අස්වනු හානිය අවමකර ගැනීමට හොඳින් පැසුනු ගෙඩි ආරක්ෂිතව නෙලාගෙන හානි සිදු නොවෙන සේ පෙට්ටිවල අසුරා ප්‍රවාහනය කිරීම වඩා උචිත වේ.

## රෝග හා පලිබෝධ

කොරපොතු කෘමීන්, පිටි මකුණන් හා කුඩිත්තන්ගේ හානිය බහුලව දක්නට ලැබෙන අතර, ඇන්ත්‍රැක්නෝස් රෝගය, පසු මැරීම ආදි රෝගද අනෝද වගාවට අහිතකර ලෙස බලපායි. කප්පාදු කිරීම සහ ක්ෂේත්‍ර පවිත්‍රතාවය මගින් මෙම කෘමි හානි සහ රෝග තත්ව පාලනය කල හැකිය. එම හානිකර තත්ව කොහොඹ වැනි ශාක ක්‍ෂාර හෝ ස්වභාවික මර්දන ක්‍රම මගින් පාලනය කිරීම අපහසු නම් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් නිර්දේශිත කෘෂි රසායනික ද්‍රව්‍ය නිර්දේශිත ප්‍රමාණවලින් භාවිතය සුදුසු වේ.


*විෂය දායකත්වය: ආචාර්ය කලපානි කැටිපේආරච්චි (පර්යේෂණ නිලධාරි)*

*ශර්ලි කාරියවසම් (කෘෂිකර්ම උපදේශිකා)*

*එරංගා වීරවර්ධන (වැඩසටහන් සහකාර)*

*ලක්ෂ්මන් ගමිලත් (වැඩසටහන් සහකාර)*



Designed by: **AUDIO VISUAL CENTRE**, Department of Agriculture, Peradeniya.
Printed by: **AGRICULTURE PRESS**, Gannoruwa.




# අනෝදා




**කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි 2011**

## හැඳින්වීම

දකුණු ඇමෙරිකානු සහ අප්‍රිකානු සම්භවයක් ඇති අනෝද ඉතා රසවත් පලතුරකි. පටු වියනක් සහිත අනෝද ශාකය මීටර් 5-11 ක් පමණ උසට වැඩේ. අනෝනාසියේ කුලයට අයත්වන අනෝද විශේෂ කිහිපයකි. කටු අනෝද, වැලි අනෝද, සීනි අනෝද, චෙරිමෝයා සහ ඇටිමෝයා විශේෂ ශ්‍රී ලංකාවේ වගාකර ඇත. එමෙන්ම අනෝද වල් දර්ශද දක්නට ලැබේ. ශාකයේ කඳ, පත්‍ර, මල්, ඵල සහ බීජ වල බාහිර රූප ලක්ෂණ වලින් එකිනෙකට වෙනස් මෙම විශේෂ, ඵලවල හැඩය සහ පලාවරණයේ ස්වභාවය අනුව පහසුවෙන් වෙන්කර හඳුනාගත හැකිය.

## කටු අනෝදා

බොහෝ විට ඕවලාකාර හැඩැති විශාල ඵලයකි. තද කොළ පැහැති ඵලාවරණය ඉදෙනවිට කහ පැහැයට හුරු කොළ පැහැයකට හැරේ. ඵලාවරණයේ කටු වැනි නෙරීම් දක්නට ලැබේ. සුදු පැහැති පල්පය ඇඹුල් රසැති පැණි රසයකින් යුතු යුෂවලින් පිරී ඇත.





## වැලි අනෝදා

ඵලය බොහෝවිට කෝනාකාර හෝ හෘදකාර හැඩයක් ගනී. ඵලාවරණය දුඹුරු පැහැයට හුරු කහ පැහැතිය. එය ඕවලාකාර රටාවන්ගෙන් සලකුණු වී ඇති නමුත් නෙරීම් දක්නට නොලැබේ. සුදු පැහැති පල්පයෙහි වැලි ආකාර ශල්කමය කොටස් අඩංගු වේ. අනෙක් අනෝද වර්ග හා සසඳන විට පල්පය පැණි රසයෙන් අඩුය.




## සීනි අනෝදා

කොළ හා දම් පැහැ ලෙස සීනි අනෝද වර්ග දෙකකි. ඵලය තරමක් ගෝලාකාර හැඩැතිය. ප්‍රමාණයෙන් කුඩාය. මදුළු කොටස් පිටතින් වෙන්කර හඳුනාගත හැකි පරිදි පැහැදිලි රවුම් හෝ ඕවලාකාර හැඩැති නෙරීම් වලින් වෙන්වී ඇත. පල්පය ඉතාමත් පැණි රසය.




## චෙරිමෝයා

බොහෝ විට හෘදයාකාර හැඩැති ඵලයේ ඵලාවරණය කොළ පැහැතිය. කෝනාකාර නෙරීම් ඵලාවරණයේ දක්නට ලැබේ. සුදු පැහැති චෙරිමෝයා පල්පය පැණි රසැතිය.




## ඇටිමෝයා

චෙරිමෝයා හා සීනි අනෝදවල දෙමුහුමක් වන එය චෙරිමෝයා හා සීනි අනෝදවල අතරමැදි ලක්ෂණ පෙන්වයි.

## ආර්ථික වටිනාකම

අනෝද පෝෂණීය අගයෙන් ඉහල නැවුම් පලතුරකි. එමගින් ක්ෂණික පලතුරු බීම, කෝඩියල් හා අයිස්ක්‍රීම් ආදි අගය වැඩි කල නිෂ්පාදන සකස්කර ගත හැකිය.

## පෝෂණීය අගය (කටු අනෝදා මාංශලය ග්‍රෑම් 100ක)

| | |
|---|---|
| ජලය | 73.0 g |
| ශක්තිය | 104.0 Kcal |
| ප්‍රෝටීන් | 1.6 g |
| මේදය | 0.4 g |
| කාබෝහයිඩ්‍රේට් | 23.5 g |
| කැල්සියම් | 17.0 g |
| පොස්පරස් | 47.0 mg |
| යකඩ | 1.5 mg |
| රයිබෝප්ලේවින් | 170.0 µg |
| තයමින් | 17.0 µg |
| නියැසින් | 0.8 µg |
| විටමින් C | 37.0 µg |

විවිධ රෝගාබාධ නිවාරණය සඳහා ඖෂධ ලෙසද අනෝද ශාක පත්‍ර, මුල්, කඳ හා බීජ භාවිතා වේ.

## ව්‍යාප්තිය

කටු අනෝද හා වැලි අනෝද ශ්‍රී ලංකාවේ පහතරට තෙත් කලාපයේ වඩාත් බහුලව දක්නට ඇත. සීනි අනෝද පහතරට වියළි කලාපයේ හා වෙරළ ආශ්‍රිත ප්‍රදේශවලත් චෙරිමෝයා ශ්‍රී ලංකාවේ උස්බිම්වලත් ව්‍යාප්ත වී ඇත.

## දේශගුණික අවශ්‍යතා

අනෝද බොහෝ විට නිවර්තන හා උප නිවර්තන දේශගුණයක් සහිත ප්‍රදේශවලට වඩා යෝග්‍ය වේ.

### කටු අනෝදා

උෂ්ණත්වය සෙල්සියස් අංශක 18 ට වැඩි, මිලි මීටර් 1500 කට වඩා වැඩි වසර පුරා පැතිරුණු වර්ෂාපතනයක් ඇත, මුහුදු මට්ටමේ සිට මීටර් 1500 ක් දක්වා වූ ප්‍රදේශවලට වඩා සුදුසුය.

### චෙරිමෝයා

උෂ්ණත්වය සෙල්සියස් අංශක 22 ට අඩු, මිලි මීටර් 900-2500 දක්වා වූ උස්බිම් වල වගාකල හැකි අතර, අධික ආර්ද්‍රතාවයට ඔරොත්තු නොදේ.

### වැලි අනෝදා

ආර්ද්‍රතාවය වැඩි ප්‍රදේශවලට වඩා සුදුසු වන අතර, අර්ධ ශුෂ්ක ප්‍රදේශවලද හොඳින් වැවේ.

### සීනි අනෝදා

පරිසර උෂ්ණත්වය වැඩි පහත්බිම් ප්‍රදේශයන්ට වඩාත්ම සුදුසුය.